**මහනුවර මහා නගර සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය.**

-----------------------------

1. **මූල්‍ය ප්‍රකාශන.**

------------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 18 දින සභාවේ නාගරික කොමසාරිස්වරයා වෙත යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය.**

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මහනුවර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

--------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු.**

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී ඉදි කිරීමේ කර්මාන්ත වෙනුවෙන් මිල දී ගෙන තිබූ ප්ලයිවුඩ් තහඩුවල වටිනාකම වූ රු.110,187 ක්, ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයේ තිබූ ඖෂධ තොගයේ වටිනාකම රු.1,047,832 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර, සභා බල ප්‍රදේශය තුළ ඇති ආයුර්වේද මධ්‍යස්ථාන 10 ක පැවති තොගය ගණනය කර ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂවලට අදාළව ලැබී තිබුණු රු.3,105,607 ක පරිත්‍යාග හා ප්‍රදාන තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඈ) පරිත්‍යාග ලෙස සභාවට ලැබී තිබූ රු.32,249,999 ක් වටිනා වාහන 08 ක අයිතිය මෙතෙක් සභාවට පවරා නොතිබූ බැවින්, එම වටිනාකම ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කළයුතු වුවත්, මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ඉතිරි කිරීම් ගිණුම් 02 ක ආයෝජනය කර තිබූ රු.4,816,852 ක බැංකු තැන්පත් ස්ථාවර තැන්පතු යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) භාණ්ඩාගාර බිල්පත් 06 ක ආයෝජනය කර තිබූ මුදල් වෙනුවෙන් ලැබියයුතු වාර්ෂික පොළිය රු.114,336 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) ලබා දී ඇති තොරතුරුවලට අනුව, වර්ෂයේ වරිපනම් බදු බිල් කිරීම් රු.264,166,704 ක් වුවත්, එය රු.264,039,607 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය තුළ මිල දී ගෙන තිබූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සහ ලී බඩු හා සවි කිරීම් රු.236,575 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(එ) 2014 වර්ෂයේ ගබඩාවට ලැබී තිබුණු රු.776,235 ක් වටිනා යන්ත්‍ර උපකරණ විෂයයන් 55 ක් හා රු.1,135,545 ක් වටිනා ලී බඩු හා සවි කිරීම් උපකරණ විෂයයන් 812 ක් සමාලෝචිත වර්ෂයේ මිල දී ගැනීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම්වලට එළඹීමට කටයුතු නොකළ එකතුව රු.2,933,361 ක් වූ ව්‍යාපෘති 11 ක වටිනාකම ණයහිමි යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඔ) දැනට වර්ෂ 05 කට අධික කාලයක සිට නාගරික රථ ගාලේ ආදායම් රු.200,567,833 ක් ලැබිය යුතුව පැවති අතර, මේ සම්බන්ධව අධිකරණයේ නියෝග මත බේරුම්කරණ මණ්ඩලයේ විභාග වෙමින් පවතින නඩුව පිළිබඳව ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ දී මිල දි ගත් හා පරිත්‍යාග ලෙස ලැබී තිබු රු.1,265,604 ක් වටිනා පුස්තකාල පොත්, ලී බඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ක) 2013 සැප්තැම්බර් සිට 2015 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව ලැබී තිබූ තානායම් කුළී රු.3,587,482 ක් තවදුරටත් ණයගැතියන් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඛ) ගෙවල් කුළී තැන්පතු ගිණුමේ තැන්පත් 03 ක් තුලනය කිරීමේ දී රු.116,840 ක් අඩුවෙන් තුලනය කර තිබුණි.

1.3.2 **නොසැසඳු පාලන ගිණුම්.**

----------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 06 කට අදාළ පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.201,311,596 ක් වූ අතර, උපලේඛනය අනුව, එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.204,376,111 ක් වූයෙන්, රු.3,064,515 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව, රු.462,211,061 ක් වූ මෝටර් රථ හා කරත්ත වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.436,444,144 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන්, රු.25,766,917 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී ආදායම් විෂයයන් 03 ක එකතු හිගය රු.103,216,145 ක් වූ නමුත්, විගණන අවස්ථාවේ ඉදිරිපත් කළ තොරතුරු අනුව එම ශේෂය රු.99,442,400 ක් වූයෙන්, රු.3,773,745 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **අවිනිශ්චිත ගිණුම්.**

---------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කලින් ලැබීම් යටතේ දක්වා තිබූ රු.24,153,371 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 **ලැබියයුතු ගිණුම්.**

--------------------

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 14 ක එකතු වටිනාකම රු.589,785,342 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.464,575,351 ක් වී තිබුණි.

**1.3.5 ගෙවියයුතු ගිණුම්.**

-------------------

2015 දෙසැම්බර් 31 දිනට රු.318,775,722 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 03 ක එකතු වටිනාකමින් රු.256,339,313 ක් වියදම් ණයහිමියෝ වූ අතර, එයින්, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.147,788,019 ක් විය. 2016 අගෝස්තු 10 දිනට ශේෂය රු.111,053,306 ක් බව නාගරික කොමසාරිස් විසින් මා වෙත වාර්තා කර තිබුණි.

1.3.6 **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

------------------------------------

ගිණුම් විෂයයන් 06 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන්, එකතුව රු.133,568,551 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.7 **නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

----------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත 127(3) | අනුකූලතා සහතික ලබා නොගෙන නිවසක පදිංචි වන අයෙකුගෙන් දිනකට රු.250 කට වැඩි නොවන දඩ මුදලක් අය කළයුතු වුවත්, නියැදියක් ලෙස හඳුනා ගත් ප්‍රමාද වී නිකුත් කළ බලපත්‍ර 15 ක් සම්බන්ධයෙන් රු.1,734,500 ක දඩ මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය - 2013<br>--------------------------------------<br>xix වැනි පරිච්ඡේදයේ 6.1 හා 6.2 වගන්ති. | සභාවට අයත් රජයේ නිවාස 10 ක පදිංචිය 1983 වර්ෂයේ දී නිලධාරීන් 10 දෙනෙකුට වර්ෂ 05 ක කාලයක් සඳහා පවරා තිබූ අතර, 2015 ජූනි 30 දින වන විට මෙම නිලධාරීන් විශ්‍රාම ගන්වා වර්ෂ ගණනාවක් ගත වී ඇතත්, එම නිවාසවල සන්තකය ආපසු පවරා |

| | | |
|---|---|---|
| | | ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම නිවාසවලින් විටින් විට නිවාස කුළී අය වන නමුත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට රු.633,336 ක නිවාස කුළී හිඟ හිටව පැවතුණි. |
| (ඈ) | 2003 අප්‍රේල් 11 දිනැති අංක සීපීසී/සීඑස්/06/06/02 දරණ මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගේ චක්‍රලේඛ ලිපිය. | ඇප තැබියයුතු නිලධාරීන් 109 දෙනෙකුගෙන් රු.284,000 ක ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2011 ඔක්තෝබර් 01 දිනැති අංක 2/2011 චක්‍රලේඛයේ 04.01 ඡේදය | වැඩි ප්‍රතිලාභීන් පිරිසකට ප්‍රයෝජනවත් වන යෝජනා සඳහා ප්‍රමුඛත්ත්වය ලබා දියයුතු වුවත්, ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව 05 කට වඩා අඩු වන කර්මාන්ත 04 ක් සඳහා රු.2,124,636 ක් සභා අරමුදලින් වැය කර තිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය.**

----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල.**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.385,165,618 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.347,248,051 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.37,917,567 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.**

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ සමස්ත අතිරික්තය ඉකුත් වර්ෂයේ සමස්ත අතිරික්තය සමග සැසඳීමේ දි, රු.118,983,503 ක අතිරික්තයේ වැඩිවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා 2015 වර්ෂයේ ආදායම් විෂයයන් 04 ක ආදායම් වැඩිවීම හා පුනරාවර්තන වියදම් විෂයයන් 03 ක හා ප්‍රාග්ධන වැය විෂයක වියදම් අඩුවීම මූලික වශයෙන් හේතු වී තිබුණි.

2.3 **ආදායම් පරිපාලනය.**

| 2015.01.01 ට හිඟය | වර්ෂයේ බිල් කළ ආදායම | එකතු කළ ආදායම | 2015.12.31 දිනට මුළු අය කලයුතු ප්‍රමාණය |
|---|---|---|---|

---------------------

2.3.1 **ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.**

-----------------------------------------

| | | | 2015 .01.01 දිනට හිගයෙන් එකතු කළ ආදායම | 2015 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | |
|---|---|---|---|---|---|
| | ----------------- | --------------- | ------------------ | ------------------ | ------------- |
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් | 145,611,674 | 264,166,705 | 82,275,688 | 225,580,659 | 101,922,032 |
| බදු කුළී | 101,080,288 | 65,123,613 | 17,379,345 | 40,616,162 | 105,943,556 |
| බලපත්‍ර ගාස්තු | -- | 27,411,245 | -- | 27,411,245 | -- |
| වෙනත් ආදායම් | 481,158,066 | 763,815,612 | 242,880,051 | 539,911,791 | 462,196,788 |
| | | | | | ------------- |
| එකතුව | | | | | 670,062,376 |
| | | | | | ======== |

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ඉහත සඳහන් ආදායම් විෂයයන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.670,062,376 ක ශේෂයක් හිග හිට පැවතුණි.

2.3.2 **වරිපනම් බදු.**

--------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී රු.145,611,674 ක හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.264,166,705 ක් විය. වර්ෂයේ අය කිරීම, හිගයෙන් සියයට 57 ක් හා බිල් කිරීම්වලින් සියයට 72 ක් වී තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට රු.101,922,031 ක ශේෂයක් අය වියයුතුව තිබූ අතර, ඒ සම්බන්ධයෙන් මහා නගර සභා ආඥා පනතේ 242 වගන්තියේ විධි විධාන අනුගමනය කර හිග ආදායම් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහා නගර සභාව විසින් තක්සේරු දෙපාර්තමේන්තුවට නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකිරීමෙන් හා නිසි පරිදි සැළසුම් කිරීමකින් තොරව අනවධානයෙන් කටයුතු කර 2002 වර්ෂයේ සිට අඛණ්ඩව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සඳහා වරිපනම් අධි තක්සේරුවක් කර තිබීම හේතුවෙන්, 2008 වර්ෂයේ දී මහා නගර සභාවට එරෙහිව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය නඩු පවරා තිබුණි. වරිපනම් අධි තක්සේරුවක් සිදු කර ඇති බවට අධිකරණය තීන්දු කිරීමෙන් පසුව එම ආයතනය නොගෙවා තිබූ එහෙත් සභාව හිග ලෙස දක්වා තිබූ වරිපනම් රු.25,852,737 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ දී ගිණුම්වලින් කපා හැර තිබුණි. මේ සම්බන්ධ තොරතුරු ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013, 2014 හා 2015 වර්ෂවල පිළිවෙළින් රු.මිලියන 114, රු.මිලියන 146 ක් හා රු.මිලියන 102 ක වරිපනම් හිගව පැවතිය දී, 1984 නොවැම්බර් 20 දිනැති අංක 1984/19 චක්‍රලේඛයේ 8.1 ඡේදයේ දැක්වෙන විධිවිධානවලට පරිබාහිරව කටයුතු කර වරෙන්තු නිකුත් කිරීමෙන් පසුව අය වන මුදල හා අධි ගාස්තු යන මුදල්වල එකතු වටිනාකමින් සියයට 03 ක කොමිස් මුදලක් ලෙස 2013, 2014 හා 2015 පළමු කාර්තුව වෙනුවෙන් සභාවේ නිලධාරින්ට හා සේවකයින්ට එකතුව රු.4,685,611 ක මුදලක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි.

2.3.3 **බදු කුළී.**

----------

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී, රු.101,080,288 ක හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.65,123,613 ක් විය. වර්ෂයේ අය කිරීම් හිගයෙන් සියයට 17 ක් හා බිල් කිරීම්වලින් සියයට 62 ක් වී තිබුණි. 2015 දෙසැම්බර් 31 දිනට රු.105,943,556 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව තිබූ අතර, බදු කුළී අය කිරීමේ දුර්වලතාවයක් පැවතිණි.

(ආ) වර්ෂ 01 ත් 29 ත් අතර කාලයක් තුළ කම්කරු නිවාස 263 කින් අයවිය යුතු රු.1,202,617 ක් වූ හිග හිටි නිවාස කුළි අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරණායක මාවතේ (දුම්රිය පොළ පාර) පිහිටි මහා නගර සභාව සතු කඩ කාමර 130 කින් කඩ කාමර 107 ක් නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීමකින් තොරව බදු දී තිබූ අතර, ඉන් කඩ කාමර 87 කින් එකවර අය විය යුතු රු.24,408,500 ක් වූ මුදල් වර්ෂ 1 ½ කට අධික කාලයක් තිස්සේ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු මාසික කඩ කුළිය, අධි ගාස්තු හා එකතු කළ අගය මත බදු ඇතුළුව රු.2,803,297 ක මුදල් ද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරවමැණික්කුඹුර අංක 14/157 දරන කඩ කාමරය 2002 මාර්තු 08 දින වසර 05 ක කාලයකට බදුකරුවෙකුට ගිවිසුමකින් පවරා තිබුණි. වසර 05 ට පසුව බදු කුළී නැවත සංශෝධනය කර, නැවත ගිවිසුම්වලට එළඹිය යුතු වුව ද, බදු ගිවිසුමේ කාලය අවසන් වී වසර 09 කට ආසන්න කාලයක් ගත වී ඇතත්, බදු කුළී සංශෝධනය කර, නැවත ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.
කඩ කාමර අතුරු බදු දී ඇති අවස්ථාවක බදුකරුගේ බලපත්‍රය අවලංගු කළයුතු වුව ද, ඊට පටහැනිව කටයුතු කළ බදුකරුවන් සම්බන්ධව සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.3.4 **ජල ගාස්තු.**

---------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී රු.91,085,736 ක ජල ගාස්තු හිගයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.503,233,797 ක් විය. වර්ෂයේ අය කිරීම් හිගයෙන් සියයට 76 ක් හා බිල් කිරීම්වලින් සියයට 82 ක් වූ අතර, 2015 දෙසැම්බර් 31 දිනට රු.104,022,946 ක හිග ජල ගාස්තුවක් තවදුරටත් අය කර ගත යුතුව තිබුණි.

2.3.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

------------------------------

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.3,078,893 ක් හා මුද්දර ගාස්තු රු.113,529,139 ක් අය වියයුතුව තිබුණි.

2.3.6 **ඉඩම් බදු**

---------

2013 ජුලි 11 දිනැති අංක 2013/06 චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධාන අනුව බදු දී වසර 30 ක් ඉක්මවා ගොස් තිබූ ඉඩම් වෙනුවෙන් ගාස්තු සංශෝධනය කර බදු අය කිරීමට කටයුතු කර නොතිබුණි. උපරිම බදු කාලය වසර 30 අවසන් වී තිබූ බදුකරුවන් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

2.4 **බැංකු සැසඳුම්.**

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) බැංකු ජංගම ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත්, ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ රු.632,291 ක් වටිනා චෙක්පත් 52ක් සම්බන්ධයෙන් 2016 අප්‍රේල් 30 දින වන විටත් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) බැංකු ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.3,049,402 ක් වටිනා චෙක්පත් 113 ක් 2016 අප්‍රේල් 30 දින වන විටත් උපලබ්ධි නොවී පැවතුණි.

(iii) බැංකු ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් බැර ශේෂවල වටිනාකම රු.8,116,890 ක් වූ අතර, 2016 අප්‍රේල් 30 දින වන විට එම වටිනාකම් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

(iv) බැංකු ගිණුම් 02 ක 2015 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් හර ශේෂවල වටිනාකම රු.1,175,628 ක් වූ අතර, එම ශේෂයන් 2016 අප්‍රේල් 30 දිනට හඳුනා ගෙන නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය.**

---------------------------

3.1 **කාර්යය සාධන ඇගයීම.**

----------------------------

සමාලෝචිත වර්ෂය තුළ සහා අරමුදල් යොදවා සංවර්ධන ව්‍යාපෘති 471 ක් ඉටු කිරීම සඳහා රු.496,665,173 ක මුදලක් සැළසුම් කර ඇස්තමේන්තු කර තිබුණි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සැළසුම් කිරිම, අධීක්ෂණය හා නිසි කළමනාකාරීත්වයකින් තොර වීම හේතුවෙන්, රු.10,870,362 ක ඇස්තමේන්තු වටිනාකමින් යුතු ව්‍යාපෘති 34 ක් ක්‍රියාත්මක නොවී අවලංගු වී තිබු අතර, රු.52,720,893 ක ඇස්තමේන්තුගත වටිනාකමින් යුතු ව්‍යාපෘති 65 ක් 2015 දෙසැම්බර් 31 දිනට ඉටු කිරීමට නොහැකිව ඉදිරි වර්ෂයේ දී ක්‍රියාත්මක කිරිමට අඛණ්ඩ කර තිබුණි. ඒ අනුව, මුලු ඇස්තමේන්තුවෙන් සියයට 21 ක් ක්‍රියාත්මක තත්ත්වයයෙන් බැහැරව පැවති බවක් නිරීක්ෂණය විය.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා.**

----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

3.2.1 **ගෙවල් කුළී මණ්ඩල තැන්පතු.**

----------------------------------

සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගෙවල් කුළී මණ්ඩල තැන්පතු රු.25,062,878 ක ශේෂයක් පැවතුණි. වර්ෂ 37 කට ආසන්න කාලයක සිට ඉදිරියට ගෙන එන ශේෂ සම්බන්ධ පාර්ශවකරුවන් ජීවත්ව සිටී ද නැද්ද යන වග සොයා බලා නිරවුල් කළ හැකි ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කිරීමකින් තොරව දිගින් දිගටම ගිණුම්වලින් ඉදිරියට ගෙන එමින් පැවතුණි.

3.2.2 **සේවක ණය.**

--------------

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මිය ගිය, විශ්‍රාම ගිය, සේවය අත හැර ගිය, වැඩ තහනම් කළ හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 185 කගෙන් වර්ෂ 01 සිට 11 ක් ඉක්ම වූ කාලයක සිට අය වියයුතු රු.9,104,735 ක ණය ශේෂයක් 2016 ජූනි 15 දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 20 දෙනෙකුගේ ණය ශේෂ නිරවුල් කිරීමේ දී රු.36,594 ක් වැඩි පුර අය කර තිබුණි.

(ඇ) 2004 වර්ෂයේ සුනාමි ව්‍යසනයෙන් අතුරුදන් වූ නිලධාරිනියකගෙන් අය වියයුතුව තිබූ රු.67,296 ක ණය ශේෂය වර්ෂ 11 කට ආසන්න කාලයක් ගතව ඇතත්, නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 1995 වර්ෂයේ ලංකා විදුලි බල මණ්ඩලයට අනුයුක්ත වූ නිලධාරීන් 34 කගෙන් අය වියයුතු රු.77,261 ක ණය ශේෂයක් හා නිලධාරීන් 30 කගේ ණය අය කිරීමේ දී වැඩි පුර අය කරන ලද රු.122,503 ක් වර්ෂ 20 ක කාලයක් තිස්සේ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2.3 **විදුලි බල මණ්ඩලයට පවරා තිබූ ණයගැති හා ණයහිමි ශේෂ.**

----------------------------------------------------------------------

1995 වර්ෂයේ දී මහා නගර සභාවේ විදුලි අංශය ලංකා විදුලි බල මණ්ඩලයට පැවරීමේ දී තිබූ රු.43,599,525 ක ණයගැති ශේෂයක් හා රු.50,443,103 ක ණයහිමි ශේෂයක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2.4 **ස්ථාවර වත්කම් ලේඛනය.**

------------------------------

සභාව සතු රු.880,086,643 ක් වටිනා වාහන 34 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර නොතිබුණි.

3.2.5 **ලේඛනගත නොකළ භාණ්ඩ.**

-----------------------------------

2015 වර්ෂයේ මිල දී ගන්නා ලද රු.2,400,812 ක් වටිනා ලී බඩු විෂයයන් 1615 ක් හා රු.1,801,400 ක් වටිනා යන්ත්‍ර උපකරණ විෂයයන් 97 ක් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

-------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

3.3.1 **ඉඩම් බදු දීම.**

----------------

(අ) ඉඩම් බදු දීමේ දී මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 36(i)(iii) හා 40(ඊ) වගන්ති අනුව, ජනාධිපතිවරයාගේ ලිඛිත එකගතාවය හා 2013 ජූලි 11 දිනැති අංක 2013/06 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 6.5 ඡේදය අනුව විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගතයුතු වුවත්, එලෙස අනුමැතිය ලබා ගැනීමකින් තොරව ඉඩම් බදු දී තිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 6.3 ඡේදය පරිදි ඉඩම් බදු දීමේ දී බදුකරු ද අත්සන් කරන ලද මහා නගර සභාව විසින් නිකුත් කරන ලද ගිවිසුමක් මගින් පමණක් බදු ලබා දියයුතු වුවත්, එවැනි ගිවිසුමකින් තොරව ඉඩම් බදු දී තිබූ අවස්ථා විය.

(ඇ) මහා නගර සභාව විසින් නියමිත කලට ඉඩම් තක්සේරු වාර්තා ලබා ගැනීමට කටයුතු නොකිරීම මත බදු දී ඇති බොහෝ ඉඩම් වෙනුවෙන් අය කරනු ලබන වාර්ෂික බදු මුදල් රු.80 ත් රු.900 ත් අතර පරාසයක් තුළ පැවතුණි. එහෙත්, නගරයේ වර්තමාන මිල ගණන් හා සැසඳීමේ දී මහා නගර සභාව විසින් අය කරනු ලබන බදු කුළී මුදල් ඉතා අඩු මට්ටමක පවතින අතර, මේ හේතුවෙන් නගර සභාවට අය වීමට ඇති විශාල ආදායමක් අහිමි වී තිබුණි.

(ඈ) මහා නගර සභාව විසින් ඉඩම් බදු දී ඇති බදුකරුවන්ගේ විස්තර ඇතුළත් කරමින් ඉඩම් බදු ලේඛනයක් ඉඩම් අංශය විසින් පවත්වා තිබුණ ද, එම ලේඛනය 2012 න් පසු යාවත්කාලීන කර නොතිබුණි. නියැදියක් ලෙස කළ පරීක්ෂාවේ දී බදුකරුවන් 11 දෙනෙකුගේ නම් එයට ඇතුළත් කර නොතිබුණි.

3.3.2 **සම්පත් පියස මධ්‍යස්ථාන.**

-----------------------------

(අ) මහා නගර සභාව විසින් එකතු කරනු ලබන නොදිරන ඝණ අප ද්‍රව්‍ය නැවත අළෙවියේ දී ලදුපත් නිකුත් කිරීමකින් තොරව මුදල් අය කර තිබුණි. 2015 ඔක්තෝබර් 06 දින හිස් වීදුරු බෝතල් අළෙවියේ දී ලබා ගෙන තිබූ රු.10,000 ක අත්තිතාකරම් මුදල සඳහා ලදුපත් නිකුත් කර නොතිබූ අතර, එය මුදල් පොතට හෝ වෙනත් ලේඛනයක සටහන් කර නොතිබුණි.

(ආ) සම්පත් පියස මධ්‍යස්ථාන ඝන අපද්‍රව්‍ය එකතු කිරීමේ දී හා අළෙවි කිරීමේ දී ස්ථානභාර වැඩ බලන පරිපාලකගේ අභිමතයට අනුව ගැණුම් හා අළෙවි මිල තීරණය කර තිබූ අතර, ඒ සඳහා අධීක්ෂණ නිලධාරියෙකුගේ අනුමැතියක් ලබා ගැනීමේ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණි.

3.3.3 **මහයියාව මහල් නිවාස ව්‍යාපෘතිය.**

--------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මහා නගර සභාවට අයත් මහයියාව ප්‍රදේශයේ භූමියක අනවසරයෙන් පදිංචි වී සිටින අඩු ආදායම්ලාභී පුද්ගලයින් සඳහා නිවාස සංවර්ධන අධිකාරිය සමග ඒකාබද්ධව නිවාස 200 කින් යුතු මහල් නිවාස ව්‍යාපෘතියක් ඉදි කිරීමට 1999 වර්ෂයේ සැළසුම් කර තිබුණි. මේ සඳහා මහා නගර සභාවට අයත් ඉඩමක් තාවකාලිකව නිවාස සංවර්ධන අධිකාරියට පවරා දීමේ එකගතාවය හා නිවාස අධිකාරිය විසින් මහා නගර සභාවේ මූල්‍ය දායකත්ත්වය ලබා ගැනීමේ පදනම මත නිවාස 200 ක් ඉදි කිරීම ආරම්භ කර තිබූ අතර, මහා නගර සභාව විසින් යථෝක්ත ඉඩම් කොටස නිවාස සංවර්ධන අධිකාරිය වෙත පවරා නොදීම හේතුවෙන් අදාළ නිවාස ව්‍යාපෘතියේ ඉදි කිරීම අත් හිටුවා, ඉදි කළ නිවාස 32 ක් මහා නගර සභාවට භාර දී තිබුණි. ඉදි කරන ලද නිවාස වෙනුවෙන් රු.20,000,000 ක මුදලක් නිවාස සංවර්ධන අධිකාරියට ගෙවන ලෙස මහා නගර

සභාවට දිගින් දිගටම දැනුම් දීම් කර ඇතත්, එම මුදල් ගෙවීමට හෝ ඒ සම්බන්ධව සොයා බලා නිසි එකගතාවයකට පැමිණීමට 2016 ජුනි 30 දින වන විටත් සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) නිවාස සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.20,000,000 ක මුදල ගිණුම්වලින් හෙළි දරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මෙම නිවාස ව්‍යාපෘතිය ඉදි කිරීමේ දී නිවාස සංවර්ධන අධිකාරිය හා සභාව නීත්‍යානුකූල ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඈ) ඉදි කර තිබූ නිවාස 32 නීත්‍යානුකූලව නිවාස ලාභීන්ට පැවරීමට කටයුතු නොකර අනවසර පදිංචියට ඉඩ කඩ සළසා තිබුණි. එම නිවාස මේ වන විට එම පුද්ගලයින් වෙනත් පාර්ශවයන්ට විකුණා ඇති බවටද වාර්තා වී ඇත.

(ඉ) යථෝක්ත නිවාස 32 ක් වෙනුවෙන් නිවාස සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.20,000,000 ක මුදල පියවීම සඳහා නිවාස ලාභියාගෙන් වසර 30 ක කාලයක් තුළ මාසිකව රු.1,000 බැගින් අය කිරීමට සැළසුම් කර ඇතත්, එම මුදල් අය කිරීමට කටයුතු කර නොතිබූ අතර, එකී නිවාසවල පදිංචිකරුවන්ගෙන් කිසිදු කුළියක් අය කිරීමට ද කටයුතු කර නොතිබුණි.

3.3.4 නාගරික සංවර්ධන අධිකාරී අරමුදල.
--------------------------------------

1987 සැප්තැම්බර් 30 දිනැති අංක 08 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිගේ චක්‍රලේඛයේ 02 වන ඡේදය ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරී බැංකු ගිණුමේ මුදල් එම අධිකාරියේ පූර්ව අනුමැතියකින් යුතුව පළාත් පාලන ආයතනය මගින් ආරම්භ කිරීමට අපේක්ෂා කරන සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වැය කළ හැකි ව ඇතත්, අරමුදල කිසිදු සංවර්ධන ව්‍යාපෘතියකට යොදා ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම අරමුදලේ ශේෂය රු.49,166,414 ක් වී තිබුණි.

3.3.5 **ලෝක උරුම නගර අරමුදල.**
-------------------------------

(අ) මහනුවර ලෝක උරුම නගරයේ සංවර්ධනය, එහි පුරාවිද්‍යාත්මක, සංස්කෘතික හා සෞන්දර්යාත්මක සංරක්ෂණය යන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා තිබූ අරමුදලේ සමාලෝචිත වර්ෂය අවසානයට රු.3,188,249 ක ශේෂයක් පැවතුණු අතර, 2015 වර්ෂයේ සැළකියයුතු විශේෂ ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණු බැවින්, අරමුදල නිෂ්කාර්යව පැවතුණි.

(ආ) ලෝක උරුම වෙබ් අඩවිය වෙනුවෙන් එහි නිර්මාණකරු වෙත නිර්මාණ කටයුතු සඳහා වර්ෂ 02 ක නඩත්තු කාලයක් වෙනුවෙන් රු.35,000 ක් ගෙවීම් කර ඇතත්, 2016 ජූනි වන විට එම වෙබ් අඩවිය අක්‍රීයව පැවතුණි.

3.4 **මතභේදයට තුඩුදුන් ගනුදෙනු.**
-------------------------------

ආයුර්වේද සංයෝජක තනතුර සඳහා අයදුම්පත් කැඳවා තිබිය දී, එම තනතුර සඳහා අයදුම්පත් යොමු නොකළ හා එම සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවූ පුද්ගලයින් 06 දෙනෙකුට බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව 2014 ඔක්තෝබර් 15 දින සිට ආයුර්වේද සංයෝජක තනතුරේ පත්වීම් ලබා දී එදින සිට 2015 දෙසැම්බර් 31 දක්වා රු.2,638,916 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

3.5 **හදුනාගත් අලාභ**

------------------

**CP – LH - 9537 දරන කම්පැක්ටර් රථය අනතුරට පත් වීම.**

----------------------------------------------------------------------

මහා නගර සභාවේ ඝණ අප ද්‍රව්‍ය කළමනාකරණ අංශයේ විශේෂ ව්‍යාපාති යටතේ සේවයේ යොදවා තිබුණු අංක CP – LH - 9537 දරන කම්පැක්ටර් රථය 2014 ඔක්තෝබර් 11 දින රාත්‍රී අනතුරට පත් වී අලුත්වැඩියාව වෙනුවෙන් රු.250,000 ක මුදලක් සභාව විසින් වැය කර තිබුණි. වර්ෂ 1 ½ කට අධික කාලයක් ඉක්ම ගොස් ඇතත්, මූලික පරීක්ෂණ අවසන් කර, වගකිව යුතු පාර්ශවයන් හදුනා ගැනීමට හා අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.6 **කොන්ත්‍රාත් පරිපාලනය.**

---------------------------

පහත සදහන් කරුණු නිරික්ෂණය විය.

3.6.1 **මාපනාවතුර ලේඩී මැනිං පාරේ අංක 53 අසළ ආරක්ෂක බැම්ම ඉදි කිරීම - අදියර 02 - රු.916,000**

----------------------------------------------------------------------------------------------

මහා නගර සභා ප්‍රතිපාදන යටතේ රු.916,000 ඇස්තමේන්තුවක් මත සී/ස මහනුවර විවිධසේවා සමූපකාර සමිතියට 2015 අප්‍රේල් 03 දින ඉදි කිරීම් පවරා වැඩ නිම කර, රු.916,000 ක් ගෙවා තිබුණි. ගිවිසුමට අනුව, කර්මාන්තය භාර දී මාස 03 ක් යන තෙක් අදාළ කොන්ත්‍රාත්කරු විසින් නඩත්තු කටයුතු කළයුතු වුව ද, මාස 02 ක් ඉක්මවීමටත් ප්‍රථම 2015 ජූනි 29 දින අත රැදවුම් ගෙවා තිබුණි.

3.6.2 **ගල්කන්ද වත්ත පාර තෙන්නකෝන් මහතාගේ නිවස අසළින් වූ මාර්ග සංවර්ධනය කිරීම රු.185,000**

--------------------------------------------------------------------------------------------------

සභා ප්‍රතිපාදන මත රු.185,000 ක ඇස්තමේන්තුවකට අනුව, ලෙව්ල දොඩම්වල ග්‍රාම සංවර්ධන සමිතියට 2015 මාර්තු 30 දින ඉදි කිරීම් පවරා වැඩ නිම කර රු.185,000 ක් ගෙවා තිබුණි. ඇස්තමේන්තුවේ හා ලිපිගොනුවේ ගල්කන්ද වත්ත පාරේ තෙන්නකෝන් මහතාගේ නිවස අසළින් යන පාර සංවර්ධනය කිරීම යනුවෙන් දක්වා තිබුණ ද, එක් නිවසකට පිවිසීම සදහා එකී නිවැසියාගේ ඉඩමේ මාර්ගයට බැවුම් වූ කොටසේ පියගැට පෙළක් ඉදි කර තිබූ බව 2015 සැප්තැම්බර් 02 දින කරන ලද භෞතික පරීක්ෂාවේ දී, අනාවරණය විය.

3.6.3 **විජේනායක වත්ත අතුරු පාර ප්‍රතිසංස්කරණය (නඩත්තු) කිරීම රු.454,881**

----------------------------------------------------------------------------------

මීටර් 200 ක කොටසක් ඍජු ශ්‍රමය මත තාර දැමීමේ කටයුතු ආරම්භ කර තිබූ අතර, 2015 සැප්තැම්බර් 02 දින මේ සම්බන්ධව සිදු කළ භෞතික පරීක්ෂාවේ දී පහත කරුණු නිරික්ෂණය විය.

(අ) මාර්ග සංවර්ධනය සදහා යොදා ගනිමින් තිබූ ABC මිශ්‍රණයේ මැටල් ප්‍රමාණය අවමව තිබූ අතර, ගල් කුඩු ප්‍රමාණය, ගල් ප්‍රමාණය මෙන් දෙගුණයටත් වඩා වැඩි ප්‍රමාණයකින් යුක්ත වුණි.

(ආ) නඩත්තු කටයුතු සදහා යොදා ගෙන තිබූ අගල් 1 ගල් මිනිරන් සහිත කුඩු වෙන සුළු ග්‍රැනයිට් ප්‍රමාණය අවම වූ ප්‍රමිතියෙන් අඩු ගල් වූ අතර, එම ගල් රෝල මගින් තැලීමේ දී කුඩු වන ස්වාභාවයක් නිරික්ෂණය විය.

3.6.4 **වාරියපොළ ශ්‍රී සුමංගල මාවතේ අංක 29/4 අසළ ආරක්ෂක බැම්ම ඉදි කිරීම 1 හා 2 අදියර - 2015**

------------------------------------------------------------------------------------------------------

මහනුවර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය හා මහනුවර මහා නගර සභාවේ අරමුදල් භාවිතා කර, රු.1,622,011 ක් වැය කර පෞද්ගලික නිවසක ආරක්ෂාව සඳහා ආරක්ෂිත බැම්මක් ඉදි කර තිබූ බව 2015 සැප්තැම්බර් 02 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අණාවරණය විය.

### 3.6.5 මහනුවර මහා නගර සභාවේ ජල කර්මාන්ත දෙපාර්තමේන්තුව සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම.

ජල කර්මාන්ත දෙපාර්තමේන්තුව සඳහා ගොඩනැගිල්ලක් ඉදි කිරීම රු.82,300,350 ක වටිනාකමකට 2015 සැප්තැම්බර් 25 දින පුද්ගලික කොන්ත්‍රාත්තුකරුවෙකුට පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ හා 2003 සැප්තැම්බර් 05 දින අංක 1304/18 දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ වලංගු සහ බලාත්මක කරන ලද අංක 1249 හා 2002 අගෝස්තු 09 දින දරන ගැසට් පත්‍රයේ iv(අ) කොටසේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවෙහි iii වන කොටස 4(ආ)(i) වගන්තියට අනුව, රු.500,000 ක් හෝ ඊට අඩු කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිළ ගණන් කැඳවිය හැකි වුවත්, රු.97,258,259 ක ඇස්තමේන්තු වටිනකාමකින් යුතු යථෝක්ත ඉදි කිරීම සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන බව ප්‍රසිද්ධ කර, ඒ අනුව කොන්ත්‍රාත්කරු තෝරා ගෙන තිබුණි. එසේම, ටෙන්ඩර් පරිපාටිය හා ටෙන්ඩර් කොන්දේසි පිළිබඳ සළකා බැලීමකින් තොරව ඉදි කිරීම් පවරා තිබුණි.

(ආ) මෙම ටෙන්ඩරය සඳහා ඉදිරිපත් වී ඇති රාජ්‍ය ආයතන වන ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය අනුබද්ධිත මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික ආයතනය හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව යන ආයතන වෙත විමසීම් කර එකගතාවයට පත්වීම පිළිබඳව සළකා බැලීමට ටෙන්ඩර් ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණ ද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉදි කිරීම් කටයුතු ආරම්භ කර තිබූ යථෝක්ත ගොඩනැගිල්ලේ ඉදි කිරීම් පිළිබඳව 2016 පෙබරවාරි 03 හා 05 යන දිනයන් හීදී කරන ලද භෞතික පරික්ෂාවේ දී පහත කරුණු අනාවරණය විය.

(i) ඉදි කරමින් පැවති කොන්ක්‍රීට් ඇතිරුම් සඳහා මයිකා ප්‍රමාණය වැඩි ¾ " ගල් සමග චිප්ස් මිශ්‍ර ප්‍රමිතියෙන් හා ගුණාත්මක බවින් අඩු ¾ " ගල් කොන්ක්‍රීට් මිශ්‍රණය සඳහා යොදා ගෙන තිබුණි.

(ii) පළුදු කර බැලීමේ දී නිසි පරිදි ශක්තිකරණය වී නොතිබූ අතර, එම කොන්ක්‍රීට් ඇතිරුම පහසුවෙන් ගැල වී යන තත්ත්වයක පැවතුණි.

(iii) පැති බැම්ම හා නිම කර තිබූ කුළුණු පාදම් කොන්ක්‍රීට් යෙදීම සඳහා මඩ සහිත ගුණාත්මක බවෙන් අඩු වැලි භාවිතා කර තිබුණි.

(iv) පූර්ව අනුමැතියකින් හා නිසි උපදෙස් ලබා ගැනීමකින් තොරව පැති බැම්ම දෙපස ලොකු ගල් (Boulders) අතුරා තිබුණි.

(v) වැඩ බිම සඳහා වූ විස්තරාත්මක සැළසුම් (Designs) කොන්ත්‍රාත්කරු විසින් පිළියෙළ කර සභාවේ ඉංජිනේරු වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගතයුතුව තිබුණ ද, 2016 පෙබරවාරි 17 දින වන විටත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

**3.6.7 මහා නගර සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම.**

---------------------------------------------------------

රු.5,600,000 ක ඇස්තමේන්තුවක් අනුව, රු.4,921,336 ක මුදලකට පුද්ගලික කොන්ත්‍රාත් කරුවෙකුට 2012 සැප්තැම්බර් 18 දින ඉදි කිරීම් පවරා තිබුණි. වැඩ ආරම්භ කිරීමෙන් පසුව 2015 සැප්තැම්බර් 15 දින වන විට රු.92,280,722 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තු 06 ක් යටතේ අවස්ථා 06 කදී රු.89,342,796 ක මුදලකට කොන්ත්‍රාත්තු පිරිනමා එදින වන විට රු.58,655,847 ක් ගෙවීම් කර තිබුණි.

මේ සම්බන්ධව පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) මුළු ගොඩනැගිල්ල සඳහා එක වර පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙළ කර, ඒ අනුව එක් එක් අදියර සඳහා වෙන වෙනම ඇස්තමේන්තු පිළියෙළ කළයුතු වුවත්, මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙළ නොකර, එක් එක් අදියරයට අදාළ වන පරිදි ඇස්තමේන්තු පිළියෙළ කර, කොන්ත්‍රාත් පැවරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. මේ අනුව, 2015 සැප්තැම්බර් 15 දින වන විට රු.92,280,722 ක් වූ එකතු වටිනාකමට අදාළ ඉංජිනේරු ඇස්තමේන්තු 06 ක් පිළියෙළ කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ 2003 සැප්තැම්බර් 05 දින හා අංක 1304/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙන් වලංගු සහ බලාත්මක කරන ලද අංක 1249 හා 2002 අගෝස්තු 09 දින දරන ගැසට් පත්‍රයේ iv(අ) කොටසේ පළ කරන ලද අතුරු ව්‍යවස්ථාවෙහි iii වන කොටස 4(ආ)(i) වගන්තියට අනුව, රු.500,000 ක් හෝ ඊට අඩු කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිළ ගණන් කැඳවිය හැකි වුවත්, රු.92,280,722 ක ඇස්තමේන්තු වටිනකමින් යුතු යථෝක්ත ඉදි කිරීම සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවන බව ප්‍රසිද්ධ කර, ඒ අනුව කොන්ත්‍රාත්කාරු තෝරා ගෙන තිබුණි. එසේම, ටෙන්ඩර් පරිපාටිය හා ටෙන්ඩර් කොන්දේසි පිළිබඳ සළකා බැලීමකින් තොරව ඉදි කිරීම් පවරා තිබුණි.

(ඇ) නගර සභාවේ සුදුසුකම් සහිත ඉංජිනේරු තාක්ෂණ හා සැළසුම් ශිල්පීන් සිටිය දී විධිමත් සැළසුම්, විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් හා ගෙබිම පස් පරීක්ෂා කිරීම් යනාදිය සිදු නොකර, අවිධිමත්ව ටෙන්ඩර් කැඳවා, ඉදි කිරීම් ආරම්භ කිරීමෙන් පසුව භූමියේ පස් පිළිබඳව ගැටළු මතු වී තිබුණි. ගෙබිම පස් පිළිබඳව පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් ලබා දුන් වාර්තාවෙන් පසුව මුල් සැළසුම හා ඇස්තමේන්තු වෙනස් කර රු.4,566,894 කට නව ඉංජිනේරු ඇස්තමේන්තුවක් පිළියෙළ කර, පෙර ගිවිසුම්ගත කොන්ත්‍රාත්කරු සමගම 2013 අප්‍රේල් 03 දින නව ගිවිසුමකට එළඹ තිබුණි. එසේම, 2012 සැප්තැම්බර් 18 දින ඇති කර ගෙන තිබූ ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කර ද නොතිබුණි.

(ඈ) ගෙබිම අත්තිවාරම කැපීම සඳහා ඝන මීටර් 01 කට රු.700 ක් ඇස්තමේන්තු කර ඇතත්, කොන්ත්‍රාත්කරු විසින් ඒ සඳහා ඉදිරිපත් කර තිබූ මිල රු.250 කි. එසේ තිබිය දී, වැඩ විෂය අංක 04 යටතේ බිම් මහළ අත්තිවාරම කැපීම වෙනුවෙන් අලුතින් එකතු කළ ඝන මීටර් 1300 සඳහා එක් ඝන මීටරයකට රු.625 බැගින් ඇස්තමේන්තු කර තිබීම නිසා, ඝන මීටර් 1072.35 ක් සඳහා රු.402,131 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(ඉ) සමස්තයක් ලෙස ගත් කල මෙම ගොඩනැගිල්ල අවිධිමත්ම ඉදි කිරීම් නිසා ගොඩනැගිල්ලේ වැසිකිළි පද්ධතිය සම්පූර්ණයෙන්ම අසාර්ථක වී ඇති අතර, වාහන ගාල් කිරීමට ගොඩනැගිල්ල අභ්‍යන්තරයේ ඉදි කළ කොටස ද ජලයෙන් යට වීමට පටන් ගෙන තිබුණි.

3.7 **ව්‍යාපෘති ප්‍රමාද කිරීම.**

-----------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දොරින් දොරට ගමින් ගමට වැඩසටහනේ ප්‍රතිපාදන මත සියඹලාගස්තැන්න - මාවිල්මඩ මුස්ලිම් පල්ලිය පාරේ පළමු වන පටු මග සිට දුම්රිය පාර දක්වා ඇති මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට රු.1,000,000 ක ප්‍රතිපාදන ලැබී ඇතත්, අදාළ මාර්ගය දුම්රිය රක්ෂිතයක් බව පසුව හෙළි වීම හේතුවෙන් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි. නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසුව විධිමත් සැළැස්මකට අනුව ව්‍යාපෘති හඳුනා ගැනීමට කටයුතු නොකිරීම මෙයට හේතු වී ඇති බවක් නිරීක්ෂණය කෙරේ.

(ආ) 2012, 2013 හා 2014 යන වර්ෂයන් තුළ ඉදි කිරීම් අවසන් කිරීමට සැළසුම් කර තිබූ රු.90,632,252 ක් වටිනා ව්‍යාපෘති 24 ක් සමාලෝචිත වර්ෂය අවසානයට අවිච්ඡේදව පැවතුණි. එකී ව්‍යාපෘති වර්ෂ 01 සිට 03 දක්වා කාලයක සිට ආරම්භ කර තවදුරටත් ඉදි කිරීම් අවසන් කර නොමැති ව්‍යාපෘති විය.

(ඇ) 2014 වර්ෂයේ ක්‍රියාත්මක කන්දේ වීදිය ගොඩනැගිලිවල ලෝක උරුම නාම පුවරු සවි කිරීමේ වැඩසටහනේ වෙළඳ ව්‍යාපාර 28 ක් හඳුනා ගෙන ඇතත්, වර්ෂ 02 ක කාල ප්‍රමාදයකින් යුතුව එක් වෙළඳ ව්‍යාපාරයක පමණක් නාම පුවරු සවි කර තිබුණි.

3.8 **ඝන අප ද්‍රව්‍ය කළමනාකරණය.**

-------------------------------------

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සෞඛ්‍ය කළාප 06 කට බෙදා නිලධාරීන් හා සේවකයින් 567 ක් වාහන, කරත්ත හා යන්ත්‍ර උපකරණ 263 ක් යනා දී සම්පත් යොදවා දෛනිකව එකතු කරනු ලබන කසළ ටොන් 130 ක් පමණ කොම්පෝස්ට් නිෂ්පාදනයට හෝ වෙනත් ක්‍රමවේදයක් යොදා ගැනීමකින් හා නිසි කළමනාකරණයකින් තොරව පරිසර බලපත්‍ර රහිතව ගොහාගොඩ පිහිටි තේක්කවත්ත ඉඩමට බැහැර කරනු ලබන බව අනාවරණය විය. මේ හේතුවෙන් එම ප්‍රදේශය අවට ජීවත්වන ජනතාව අතර විවිධ රෝග පැතිර යාමේ අවදානමක් හා ඉඩකඩක් පැවති අතර, පරිසරය දූෂණය වී ප්‍රදේශය අප්‍රසන්න තත්වයට පත් වෙමින් පැවතුණි.

3.9 **වාහන පාලනය.**

------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේ අනතුරට පත් අංක 253-3800 දරන වාහනයට සිදු වී ඇති රු.380,460 ක පාඩුව අය කර ගැනීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කිරීමකින් තොරව ගිණුම්වලින් ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ආ) 252 - 4088 අංක දරන වාහනය 2015 දෙසැම්බර් 04 දින 20.45 පැයට රියැදුරු විසින් අනුමැතියකින් තොරව සභා භූමියෙන් පිටතට රැගෙන ගොස් එදින රාත්‍රියේ අනතුරට ලක් කිරීම හා බීමත්ව රිය පැදවීම සම්බන්ධව පොලිසිය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇතත්, එම

සිදු වීම සම්බන්ධයෙන් වාහන භාර නිලධාරීන් ලිඛිතව වාර්තා කර නොතිබුණි. රියැදුරු සම්බන්ධයෙන් ද විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකර 2015 දෙසැම්බර් 10 දින එකී රියැදුරුට විශ්‍රාම යාමට ඉඩකඩ ලබා දී තිබුණි. හානියට පත් වාහනය අලුත්වැඩියා කිරීම විධිමත්ව සිදු නොකර, අනතුර සිදු කළ රියැදුරු විසින් මිල ගණන් ලබා ගෙන අලුත්වැඩියාව රියැදුරු ලවා සිදු කර ගැනීමේ අවිධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි. එසේම, යාන්ත්‍රික ඉංජිනේරුවරයාගේ තක්සේරු වාර්තාවක් සකස් කිරීමකින් තොරව අදාළ රියැදුරුගේ අභිමතය පරිදි මිල ගණන් කැඳවා අලුත්වැඩියා කිරීමට ඉඩකඩ සළසා තිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.

------------------------------------

### 4.1 අයවැය පාලනය.

------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත වියදම්, තථ්‍ය වියදම් සමග සැසඳීමේ දී වියදම් විෂයයන් 06 ක සියයට 23 සිට සියයට 93 දක්වා විචලනයක් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) වාර්ෂික අයවැය ලේඛනයේ ප්‍රාග්ධන වැය විෂයය 35517 II යටතේ ගොහාගොඩ කසළ අංගණයට රු.5,000,000 ක් සහ කර්මාන්ත හා සෞඛ්‍ය කළාප කාර්යාලවල වැසිකිළි සෑදීම සඳහා රු.750,000 ක මුදලක් වෙන් කර ඇතත්, එකී ප්‍රතිපාදනවලින් පෙර පාසල් සංවර්ධනය හා ක්‍රීඩාගාර අලුත්වැඩියාව සඳහා රු.67,293 ක් වැය කර තිබුණි.

(ඇ) වාර්ෂික අයවැය ලේඛනයේ ප්‍රාග්ධන වැය විෂයය 11517 iv යටතේ නගර ශාලාව නවීකරණය කිරීම සඳහා රු.2,500,000 ක මුදලක් වෙන් කර ඇතත්, මෙම මුදලින් රු.507,495 ක මුදලක් දොඩම්වල කුඩා රත්වත්ත මාවත අඩක් ඉදි කිරීම සඳහා යොදා ගෙන තිබුණි.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.

----------------------------------

රු.267,284,106 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

### 4.3 වත්කම් කළමනාකරණය.

------------------------------

#### 4.3.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

----------------------------------------

(අ) සභාව සතු දෙපාර්තමේන්තු 11 ක, ආයුර්වේද නිෂ්පාදනාගාරය හා ආයුර්වේද මධ්‍යස්ථාන 10 ක වටිනාකම හඳුනා ගෙන නොතිබූ වත්කම් ඒකක 478 ක් වර්ෂයක කාලයකට පෙර සිට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතුණි.

(ආ) **වෙනත් අරමුදල්.**

-------------------

පොදු අරමුදල යටතේ ගිණුම්ගත කර තිබූ එකතු වටිනාකම රු.6,443,390 ක් වූ අරමුදල් 03 ක් වර්ෂ ගණනාවක සිට ක්‍රියාකාරීත්ත්වයකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි.

(ඇ) **නිෂ්කාර්ය සංචිත අරමුදල්.**

--------------------------------

ආයෝජන යටතේ ගිණුම්ගත වී ඇති එකතු වටිනාකම රු.24,019,458 ක් වූ සංචිත අරමුදල් 3 ක් 1980 වර්ෂයේ සිට වර්ෂ 35 කට අධික කාලයක් ක්‍රියාකාරිත්වයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

4.3.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය.

---------------------------------

මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව මහා නගර සභාවට අයත් දෙපාර්තමේන්තු 15 ක හා අංශ 05 ක සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2016 ජූලි 30 දින වන විටත් සිදු කර නොතිබුණි.

4.3.3 සංයුක්ත සැළැස්ම.

----------------------

සමාලෝචිත වර්ෂයට අදාළ සංයුක්ත සැළැස්ම පිළියෙළ කර නොතිබුණි.

4.3.4 ක්‍රියාකාරී සැළැස්ම.

----------------------

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.

5. පද්ධති හා පාලනය.

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) වත්කම් කළමනාකරණය
(උ) ණයගැති හා ණයහිමි පාලනය